**ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2021**
---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුළ තාවකාලික බස්රථ ධාවනය සඳහා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ලබාදී තිබූ අවසරපත් 25 බැගින් වූ පොත් 16 ක් විගණිත දිනය දක්වා ලැබී නොතිබුණු අතර ඊට අදාළ ආදායමද ගිණුම්වලට ඇතුළත්වී නොතිබුණි. | 2021 වර්ෂය තුළදී දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ලබාදී තිබූ තාවකාලික අවසරපත්‍ර පොත් අතරින් තවදුරටත් පොත් 07 ක් පමණක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබිය යුතු අතර, එය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ආදායම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | බස්රථ හිමියෙකුට රු.300,000 බැගින් බස්රථ හිමියන් 510 කට රාජ්‍ය බැංකු 02 කින් ලබාදුන් රු.153,000,000 ක ණය මුදල් වෙනුවෙන් ආයතනය ඇපවීම නිසා ආයතනයට එම ප්‍රමාණයෙන් අසම්භාව්‍ය බැරකමක් ඇති වී තිබුණද, 2021 වර්ෂය මූල්‍ය ප්‍රකාශනවල එම අසම්භාව්‍ය බැරකම හෙළිදරව් කර නොතිබුණි. | විමසුමේ සඳහන් අසම්භාව්‍ය බැරකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | අසම්භාව්‍යයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ශේෂය රු.55,608,904 ක් වන අතර, ඒ සඳහා ටෙන්ඩර් තැන්පතු ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නොතිබුණි. | ටෙන්ඩර් තැන්පත් ලේඛනයක් නඩත්තු කළ යුතු වේ. |

## 1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1. ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට බැස්ටියන් මාවත පොදු වැසිකිළි පද්ධතිය වෙනුවෙන් කුලිය ලෙස කුලී ගිවිසුම්ගත සමාගමෙන් රු.7,609,660 ක මුදලක් ලැබිය යුතුව තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලැබිය යුතු මුදල් නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.1.2 වගන්තිය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවක රක්ෂණ හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා රු.6,666,198 ක් වියදම් දරා තිබුණි. | 2018 වර්ෂයේදී ජාතික රක්ෂණාභාර අරමුදල මගින් අර්ධ රාජ්‍ය සේවකයින් සඳහා හඳුන්වා දුන් අග්‍රහාර රන් රක්ෂණ යෝජනා ක්‍රමය අනුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවකයින් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට දායක කර ඇත. | සුභසාධන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත කටයුතු කළ යුතු වේ. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වෙනි වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත කොමිෂන් සභාව විසින් ස්ථාවර තැන්පතු රු.44,842,369 හා රු.15,645,319 භාණ්ඩාගාර බිල්පත්හි 2021 දෙසැම්බර් 31 දිනට ආයෝජනය කර තිබුණි. තවද, එදිනට රු.379,238,858 ක් කෙටි කාලීන අයෝජනවල යොදවා තිබුණි. | තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය වෙත 2019.02.07 දිනැතිව ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර මේ දක්වා එයට පිළිතුරක් ලැබී නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි. | ආයෝජනය කිරීම සඳහා අදාළ අනුමැතිය යටතේ සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.9 වගන්තිය | කළමනාකරණ සහකාරිනියක් 2020 ඔක්තෝම්බර් 12 දින සිට 2021 අගෝස්තු 18 දින දක්වා ප්‍රවාහන අමාත්‍යාංශයේ සේවයට මුදාහැර තිබුණි. ඇයට ඉහත කාල පරිච්ඡේදය තුළදී වැටුප් ලෙස රු.584,842 ක්ද, වෛද්‍ය නිවාඩු ප්‍රතිපූර්ණය කිරීම සඳහා රු.104,480 ක්ද ප්‍රසාද දීමනා ලෙස රු.30,000 ක්ද වශයෙන් එකතුව රු.719,322 ක් ඉහත කාල පරිච්ඡේදය තුළ ගෙවා තිබුණි. අමාත්‍යාංශයට නිදහස් කිරීම සහ ආයතනයේ වැටුප් ඇතුළුව දීමනා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අනුමැතිය දැක්වෙන කිසිදු අනුමත ලිපියක් විගණනයට ඉදිරිපත් නොවිණි. | අදාළ නිලධාරිනිය 2021.08.17 දින සිට ප්‍රවාහන අමාත්‍ය සහාය කාර්ය මණ්ඩල සේවයෙන් මුදාහැර ඇති අතර, නැවත ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවයට වාර්තා කරන ලදී. ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් ගෙවා ඇති වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ප්‍රවාහන අමාත්‍යාංශය වෙත ලිඛිතව දන්වා ඇත. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.106,295,655 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.24,743,349 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,552,306 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මාර්ග ආදායම් බලපත්‍ර ටෙන්ඩර් ආදායම රු.104,639,191 ක අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2021 වර්ෂය තුළදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් තුළ ඇතුළත් මාර්ග බලපත්‍ර ආදායම සහ මාර්ග බලපත්‍ර ටෙන්ඩර් ආදායම පිළිවෙළින් සියයට 1,900 කින් සහ සියයට 385 කින් අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 0.31වන අතර එය ඉකුත් වර්ෂයේ අනුපාතය වන 0.27 ට සාපේක්ෂව වැඩි අගයක්ව පැවතීම අයහපත් තත්වයක් ලෙස නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 108 කින් අඩුවී තිබෙන බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජී.පී.එස්. පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් බස් හිමියන්ගෙන් අයකර ගත් මුදලට වඩා රු.3,530,745 ක අමතර වියදමක් දරා තිබුණි. | මෙම ව්‍යාපෘතියේ අරමුණ ආදායම් ඉපැයීම නොවන අතර පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කිරීම උදෙසා ආරක්ෂිත හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීම වන බව සඳහන් කරමි. | මෙම සේවා නඩත්තුව සඳහා ප්‍රමාණවත් ආදායමක් ලබා ගත යුතු වේ. |
| (ආ) කොමිෂන් සභාව විසින් නියමිත පරිදි පොදු වශයෙන් ගබඩාවක් පවත්වා ගෙන යනු නොලබන අතර, ගබඩාවට භාණ්ඩ ලැබීමෙන් පසු භාණ්ඩ ලැබීම් පත්‍රයක (GRN) සටහන් තැබීම සිදු කරනු නොලැබේ. අදාළ ලේඛනවල සටහන් තැබීම සිදු කරනු ලැබුවද භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම දිනපතා තුලනය කර ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අදාළ ලේඛන පවත්වාගෙන යාම සහ සටහන් තැබීම කළ යුතු වේ. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ශේෂය රු.55,608,904 ක් වන අතර, ඒ සඳහා ටෙන්ඩර් තැන්පතු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ටෙන්ඩර් තැන්පතු ලේඛනයක් නඩත්තු කළ යුතු වේ. |

### 3.2. අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් ඉලෙක්ට්‍රොනික් පෙරගෙවුම් කාඩ්පත හඳුන්වාදීම සඳහා රු.මි.8.6 ක් ද, කොමිෂන් සභාවේ කාර්යාල පරිශ්‍රයේ විදුලිබල අවශ්‍යතාවය සඳහා සූර්යකෝෂ සවිකර විදුලිය ජනනය කිරීමේ වැඩසටහනක් වෙනුවෙන් රු.මි.15 ක් ද, සමාලෝචිත වර්ෂයේ වෙන්කර තිබුණද, එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වාර්ෂික අයවැය ගත කාර්යයන් නිශ්චිත කාල රාමුව තුළ ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.3. මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 219 ක් වන අතර 2021 දෙසැම්බර් මස 31 දින වන විට තත්‍ය කාර්ය මණ්ඩලය 178 ක් විය. ඉන් 170 ක් ස්ථිර පදනමින් ද 07 ක් කොන්ත්‍රාත් පදනමින් ද සේවය කළ අතර, පුරප්පාඩු 34 ක් පැවතිණි. එම පුරප්පාඩු පිරවීමට සභාව කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩුව පවතින තනතුරු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. රජය විසින් සියලුම බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් අදාල පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. | අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2018 වර්ෂයේ සිට වසර 04 ක කාලය තුළ නිලධාරීන් 07 දෙනෙකු කොන්ත්‍රාත් පදනම යටතේ සේවයට බඳවා ගෙන තිබුණි. | මෙම සේවකයින් ස්ථිර කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් ගේ නිර්දේශයෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉල්ලීම් කර ඇත. | නිලධාරීන් ස්ථිර පදනම මත බඳවා ගැනීම කළ යුතු වේ. |

## 3.4. වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| පිළිවෙළින් පිරිවැය රු.2,952,000, රු.1,730,900 සහ රු.1,000,000 ක් වටිනා වාහන 03 ක් වසර 05 කට වැඩි කාලයක් පරිශ්‍රය තුළ තිබුණු අතර, ඒවා අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් අපහරණ කටයුතු සිදු කිරීමට සැළසුම් කර ඇත. | රාජ්‍ය චක්‍රලේක ප්‍රකාරව අදාළව වාහන අපහරණ කටයුතු කළ යුතු වේ. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ අයවැය ගත ආදායම් තථ්‍ය ආදායම් සමඟ සැසඳීමේදී සියයට 16 ක සිට සියයට 73 ක් දක්වා පරාසයක හා අයවැය ගත වියදම් තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 30 ක සිට සියයට 71 ක් දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් නිශ්චිත ඉලක්ක අනුව කටයුතු කිරීමට නොහැකි වීම මත මෙම විචලනයන් සිදුවූ අතර ඉදිරි වර්ෂයේදී විචලනයන් අවම කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ කාරකයක් ලෙස යොදා ගත යුතු වේ. |